Royal Commission
into Aged Care Quality and Safety

SINHALESE

## වැඩිහිටි රැකවරණයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන රාජකීය කොමිසම (The Royal Commission into Aged Care Quality and Safety)

වැඩිහිටි රැකවරණයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන රාජකීය කොමිසම, වැඩිහිටි රැකවරණ සේවාවල ගුණාත්මකභාවය සොයා බැලීමට හා එම සේවාවලින් ඔස්ට්‍රේලියානු සමාජයේ අවශ්‍යතා සැපිරේද යන්න සොයා බැලීමට ස්ථාපනය කර තිබේ. මෙයට පහත දැක්වෙන දෑ ඇතුළත්ය ;-

- නිවෙස්වල වාසය කරන වැඩිහිටියන් වෙනුවෙන් වන රැකවරණය
- ඩිමෙන්ෂියාව සහිත පුද්ගලයන් වෙනුවෙන් වන රැකවරණය සහ
- දුබලතා සහිත වයසින් අඩු පුද්ගලයන් ඇතුළත් ව වැඩිහිටි නිවාසවල නේවාසිකව වෙසෙන පුද්ගලයන් වෙනුවෙන් වන රැකවරණය.

නාගරිකව මෙන් ම ප්‍රාදේශීය හා දුරබැහැර ප්‍රදේශවල සැපයෙන රැකවරණය ද කොමිසම විසින් විභාග කර බැලෙනු ඇත. අනාගතයේ දී වැඩිහිටි රැකවරණ දියුණු කළ හැක්කේ කෙසේදැයි සළකා බැලීම ද සිදු වේ.

## වැඩිහිටි රැකවරණ සේවාවක් සම්බන්ධයෙන් ඔබට කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය ගැටලුවක් පවතියි නම්

තනි පුද්ගල ආරවුල් හෝ පැමිණිලි විසඳීමට රාජකීය කොමිසමට හැකියාවක් නැත. සේවා සපයන්නෙකුට හෝ පුද්ගලයෙකුට යමක් කිරීමට හෝ වන්දියක් ගෙවන සේ නියෝග කිරීමට ද කොමිසමට හැකියාවක් නැත. කෙසේ වෙතත්, වැඩිහිටි රැකවරණයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන කොමිසම, ඔස්ට්‍රේලියානු රජයේ සහනාධාර සහිත වැඩිහිටි රැකවරණ පිළිබඳ පැමිණිලි ආයතනය වන නිසා, මේ සම්බන්ධයෙන් උපකාර කිරීමට සමහර විට හැකි වනු ඇත.

කිසියම් පුද්ගලයකු සඳහා දැනට සැපයෙන වැඩිහිටි රැකවරණ සේවාවල ගුණාත්මකභාවය ගැන පැමිණිළි කිරීමට අවශ්‍ය නම්, 1800 951 822 ඔස්සේ හෝ agedcarequality.gov.au වෙබ් අඩවිය ඔස්සේ වැඩිහිටි රැකවරණ ගුණාත්මකභාවය හා ආරක්ෂාව සම්න්ධයෙන් වන කොමිසම ඇමතීමට ඔබට හැකිය. භාෂණ පරිවර්තන සේවා ලබාගත හැකිය.